පළමු වාර පරීක්ෂණය - 2023 අප්‍රේල්

13 ශ්‍රේණිය

ජීව විද්‍යාව I
Biology I

09 S I

පැය දෙකයි
Two hours

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) පහත පිළිතුරු අතරින් නිවැරදි යුගලය තෝරන්න.
1) වර්ධනය - ජීවියෙකුගේ ජීවිත කාලය තුළ දී සිදුවන සියලු අප්‍රතිවර්ත්‍ය වෙනස්වීම්
2) සමායෝජනය - බාහිර හා අභ්‍යන්තර පරිසරවලින් පැමිණෙන උත්තේජවලට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව
3) පරිණාමය - ප්‍රවේණික ද්‍රව්‍යවල සිදුවන විකිරණවලට අනුකූලව කාලයක් සමඟ ජීවීන්ට වෙනස් වීමට ඇති හැකියාව
4) විකසනය - විශේෂයක අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම සඳහා නව ජනිතයන් බිහිකිරීමේ හැකියාව
5) පරිවෘත්තිය - අප්‍රතිවර්ත්‍ය ලෙස සිදුවන වියළි ස්කන්ධයෙහි වැඩිවීම

02) මිනිස් දේහයේ අඩංගු අංශු මාත්‍රා මූලද්‍රව්‍යයක් නොවන්නේ,
1) B 2) Cl 3) Mn 4) Zn 5) F

03) ජලය සම්බන්ධයෙන් වැරදි වගන්තිය වන්නේ,
1) විවිධ ජල අණුවල ආකර්ෂණ හේතුවෙන් ජලයේ ගුණ ඇතිවේ.
2) ජල අණු අතර ඇති සංසක්තිය නිසා ජලයට ඉහළ පෘෂ්ඨීක ආතතියක් ලැබී ඇත.
3) ජලයේ අධික විශිෂ්ට තාපය නිසා ජීවියෙකු තුළ අවම ජල හානියක් සිදු කරමින් වැඩි තාප ශක්තියක් නිදහස් කළ හැකිය.
4) ද්‍රාව්‍යතාව, ධ්‍රැවීයතාව මත රඳා පවතී.
5) ජලයට 4°C දී උපරිම ඝනත්වයක් ඇත.

04) ග්ලයිකොසිඩික බන්ධන පවතින සංයෝගයක් වන්නේ,
1) ෆ්‍රක්ටෝස් 2) ගැලැක්ටෝස් 3) රිබියුලෝස් 4) සුක්‍රෝස් 5) ග්ලිසරැල්ඩිහයිඩ්

05) ව්‍යුහමය ප්‍රෝටීනයක් වන්නේ,
1) කෙරටීන් 2) ඇල්බියුමින් 3) ඇමයිලේස් 4) මයොග්ලොබින් 5) හිමොග්ලොබින්

06) ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන සීමාකාරී සාධකයක් නොවන්නේ,
1) අලෝක තීව්‍රතාවය
2) උෂ්නත්වය
3) ජලය
4) $CO_2$ සාන්ද්‍රණය
5) සාපේක්ෂ ආර්ද්‍රතාව

07) සත්වයන්ගේ භෞමික ගණාවාසීකරණය ඇරඹී ඇත්තේ,
1) වසර බිලියන 2.7 කට පෙර
2) මිලියන 400කට පෙර
3) වසර බිලියන 1.2 කට පෙර
4) වසර මිලියන 365කට පෙර
5) වසර මිලියන 500කට පෙර

08) බැක්ටීරියා හා ඉයුකැරියා අධිරාජධානි දෙකේම දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1) ප්‍රෝටීන සංස්ලේෂණය සඳහා RNA පොලිමරේස් වර්ග කිහිපයකි
2) පටල ලිපිඩ ශාඛනය නොවූ හයිඩ්‍රොකාබන් වේ
3) DNA සමඟ බැඳුනු හිස්ටෝන ඇත.
4) බොහෝ ජානවල ඉන්ට්‍රෝන ඇත.
5) ප්‍රෝටීන සංස්ලේෂණය සඳහා ආරම්භක ඇමයිනෝ අම්ලය මෙතියොනින් ය



22 A/L අපි [ papers grp ]
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CamScanner

09) ප්‍රෝටිස්ටා හා ඔවුන්ගේ සංචිත ආහාර අතර නිවැරදි ගැලපීම ඇති පිළිතුර වන්නේ,

1) *Sargassum* – ක්‍රයිසොලැමිනාරීන්
2) *Ulva* – ෆ්ලෝරිඩියන් පිෂ්ටය
3) *Gelidium* – පිෂ්ටය
4) Diatoms – තෙල්
5) *Euglena* – ලැමිනාරින්

10) බීජ රහිත සනාල ශාක සම්බන්ධයෙන් නිවැරදි වගන්තිය කුමක්ද?

1) ගද්ධා පාසි සියල්ල විෂම බීජානුකය.
2) ලයිකොෆයිටා හි සමහර විශේෂ සහජීවී දිලීර මගින් පෝෂණය ලබයි.
3) ටෙරොෆයිටාවන් භෞමික වාසීන් වන අතර සමහර ශාක අපි ශාක ලෙස වැඩෙයි.
4) *Lycopodium* සියල්ල සමබීජානුක වන අතර ශුකි පාසි ලෙස සලකයි.
5) සමහර ටෙරොෆයිටා විශේෂවල බීජාණු ඒක ලිංගික ජන්මානු ශාක බවට විකසනය වේ.

11) පහත සඳහන් වගන්ති අතුරින් ශාක විභාජක සම්බන්ධයෙන් සත්‍ය වන්නේ කුමක්ද?

1) පාර්ශ්වික විභාජක සහ අන්තරස්ථ විභාජක පමණක් ද්විතීයික වර්ධනය සඳහා ඉවහල් වේ.
2) ඇතැම් ද්විබීජ පත්‍රී ශාක කඳන් පාදස්ථයේ හා පත්‍ර පාදස්ථයේ අන්තරස්ථ විභාජක දක්නට ලැබේ.
3) සෛල විභාජනය හේතුවෙන් අපිචර්මය, පරිචර්මය මගින් ප්‍රතිස්ථාපනය කරනු ලබයි.
4) සනාල කැම්බියමේ පාර්ශ්වික විභාජක පවතින අතර එය සම්පූර්ණයෙන්ම ද්විතියිකය.
5) කැම්බියමේ පවතින කෙටි මූලික සෛලවල විශාල මධ්‍ය රික්තයක් පවතී.

12) පරිණත නොවූ ශාක කඳක අපිචර්මයට වහාම ඇතුළතින් ඇති සෛලවල ලක්ෂණයක් වන්නේ,

1) ද්විතියික සෛල බිත්ති ලිග්නීන්වලින් ඝන වී ඇත.
2) අනුනත විභාජනය මගින් සෛල බෙදීමේ හැකියාව ඇත.
3) ඒවා තුළ පිෂ්ට ලව පවතී.
4) දිගැටි සිහින් දෙකෙලවර උල් වූ හැඩයක් ගන්නා සෛල වේ.
5) සෛල බිත්ති අසමාකාරව ඝන වී ඇත.

13) ශාක පත්‍රවල ව්‍යුහය සැලකූ විට පහත සඳහන් කුමන වගන්තිය අසත්‍ය වේද?

1) ඉනි මෘදුස්ථර සෛල දිගැති හැඩයක් ගන්නා අතර සෛල ස්ථර එකක් ලෙස සෑම ද්විබීජ පත්‍රී ශාකයකම සකස් වී ඇත.
2) සවිවර මෘදුස්ථර සෛලවල හරිතලව ඉනිමෘදුස්ථර සෛල වලට වඩා අඩු ප්‍රමාණයක් පවතී.
3) ඒක බීජ පත්‍රී ශාක පත්‍රවල මෘදුස්ථර සෛල වර්ග දෙකක් ලෙස විභේදනය වී නොමැත.
4) පත්‍ර මධ්‍ය සෛල ස්ථරය තුළ ජාලාකාර නාරටි වින්‍යාසයක් පවතී.
5) සපුෂ්ප ශාකවල පාලක සෛල දර්ශීය වශයෙන් බෝංචි බීජ හැඩ ගනී.

14) ජල විභවය සම්බන්ධව අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

1) ශූනතා පීඩනය අකාෂ්ඨික ශාකවලට සන්ධාරක ශක්තිය ලබා දෙන අතර සෛල දික් වීමේදී ද වැදගත්කමක් දක්වයි.
2) සෛලයක $\psi_P$ සඳහා උපරිම අගයක් ඇති විට එහි ජල විභවය ද්‍රව්‍ය විභවයට සමානවේ.
3) සෛලයක ජල විභවය ශූන්‍ය වන විට එම සෛල පූර්ණ ශූනතාවයේ පැවතිය හැක.
4) විශූන සෛලයක ජල විභවය ද්‍රාව්‍ය විභවයට සමාන වේ.
5) ශෛලම වාහිනී සෛලයක සාමාන්‍යයෙන් $\psi_P$, –2MPa ට වඩා අඩුවේ.

15) පහත සඳහන් කුමන ක්‍රියාවලිය ශක්තිය වැය කරමින් සිදුවන්නේද?

1) ජලකාමී ද්‍රාව්‍ය පටලයක් හරහා පිහිටා ඇති පරිවාහක ප්‍රෝටීන අණුවල ආධාරයෙන් පරිවහනය.
2) නිදහස් ජල අණු මූල කේෂ හරහා පරිවහනය
3) $CO_2$ වායුව ප්ලාස්ම පටලය හරහා පරිවහනය
4) පෙනේර නළ තුළට ශෛලමයේ සිට ජලය ඇතුළු වීම.
5) පෙනේර නළ තුළට සුක්‍රෝස් බැර වීම.

22 A/L අපි [ papers grp



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CamScanner

16) ජීවීන් දෙදෙනාටම වාසි සැලසෙන සහජීවී සම්බන්ධතාවයක් වන්නේ,

1) අපිශාක ඕකිඩ් සහ ධාරක ශාකය
2) *Cuscuta* සහ අඹ ශාකය
3) *Cycas* කොරල් නැඹ මුල් හා *Anabaena*
4) *Utricularia* සහ ඕකිඩ් ශාකය
5) *Loranthus* සහ ධාරක ශාකය

17) ශාකවල පත්‍ර රළි වැටීම ඇති වන්නේ පහත සඳහන් කුමන මූලද්‍රව්‍යය / මූලද්‍රව්‍ය ඌන වීමෙන්ද?

1) Ca 2) Ca සහ Zn 3) Zn 4) Zn සහ S 5) P සහ S

18) රේණු වලට සාපේක්ෂව පුෂ්පයක කීලය විවිධ මට්ටම්වලින් පැවතීම හඳුන්වන්නේ කෙසේද?

1) ස්වවන්ධ්‍යතාව
2) විෂමකීලතාව
3) ඒක ලිංගික පුෂ්ප
4) ද්විලිංගික බව
5) ද්විගෘහී ශාක

22 A/L අපි [ papers g

19) පත්‍ර වෘද්ධතාව පමා කිරීම හා දිරි ගැන්වීම සඳහා බලපාන හෝර්මෝන පිළිවෙලින් මොනවාද?

1) සයිටොකයිනින් සහ ඇබ්සිසික් අම්ලය
2) සයිටොකයිනින් සහ ගිබරලින්
3) ඇබ්සිසික් අම්ලය සහ ඔක්සීන
4) එතිලින් සහ සයිටොකයිනින්
5) ඔක්සින සහ එතිලීන්

20) පෙරසිට පැවති ව්‍යුහමය ආරක්ෂක යාන්ත්‍රණයක් වන්නේ,

1) සෛල බිත්තිවල ලිග්නින් පැවතීම.
2) සෛල බිත්තිවල රූප විද්‍යාත්මක වෙනස් වීම.
3) වල්කය හා ඡේදස්තරය
4) අපිචර්මීය සෛල බිත්තිවල ව්‍යුහය හා ඝනකම
5) ට්‍රිකෝමවල පවතින විෂ සංයෝග

21) පහත සඳහන් ඒවා අතරින් පෙණහැලි වාතනය වීම හා සම්බන්ධව නිවැරදි වන්නේ,

1) මිනිසාගේ ශ්වසනය ඍණ පීඩන ශ්වසනයක් ලෙස හැඳින්වෙන අතර එහිදී පෙනහළු තුළට වාතය තල්ලු කරයි.
2) අන්තර් පර්ශුක පේශී හා මහා ප්‍රාචීර පේශී සාංකෝචනයෙන් උරස් කුහරයේ පරිමාව ඉහළ යයි.
3) ආශ්වාස ප්‍රාශ්වාස ක්‍රියාවලිය අන්තර් පර්ශුක පේශී හා ප්‍රාචීර පේශිවල සංකෝචනය මත පමණක් රඳා පවතී.
4) ගෙල, පිට ප්‍රදේශය හා පපු ප්‍රදේශයේ පිහිටි අතිරේක පේශී ශ්වසනය සඳහා දායක වේ.
5) අන්තරංග ප්ලූරාව හා පාර්ශ්වික ප්ලූරාව යන පටල දෙක එකිනෙක මත සුමට ලෙස ලිස්සා යාම නිසා පෙණහැලි තුල පරිමාව වැඩිවේ.

22) ආශ්වාස ප්‍රාශ්වාස ක්‍රියාවලියේ සමස්ථිතික යාමනය පිළිබඳ අසත්‍ය වන්නේ,

1) ශ්වසන ක්‍රියාවලියේ පාලන මධ්‍යස්ථාන දෙකක් සුෂුම්නා ශීර්ෂකයේ තිබෙන අතර එමගින් ශ්වසන ක්‍රියාවලියේ රිද්මය යාමනය කරනු ලබයි.
2) පෙනහැලි පටක ඇදී පවතින විට එය හඳුනා ගැනීමට හැකි සංවේදක පෙනහැලි තුළම පිහිටයි.
3) සුෂුම්නා ශීර්ෂකයේ, මහා ධමනියේ හා ශීර්ෂපෝෂී ධමනියේ පවතින සංවේදක මගින් pH වෙනස් වීම හඳුනාගනී.
4) pH අගය වැඩිවූ විට සුෂුම්නා ශීර්ෂකයේ පාලන පරිපථ ක්‍රියාකාරී වෙමින් ශ්වසනයේ ගැඹුර හා වේගය වැඩි කරයි.
5) වැරෝලි සේතුවේ පිහිටන අතිරේක ස්නායු පරිපථ මගින් ශ්වසන යාමනය නිසි ලෙස හසුරවයි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CS CamScanner

23) නිවැරදි සම්බනධතාවය තෝරන්න.

1) ඇනිලිඩා - මොළය, උදරීය ස්නායු රැහැන්, ගැංග්ලියා යුගල
2) කෝඩේටා - මොළය, පෘෂ්ඨීය. ස්නායු රැහැන, ස්නායු හා ගැංගලියා
3) එකයිනොඩමේටා - ස්නායු රැහැන්, අරීය ස්නායු
4) ආත්‍රපෝඩා - මොළය, පෘෂ්ඨීය ස්නායු රැහැන්, ඛණ්ඩික ගැංග්ලියා
5) ප්ලැටිහෙල්මින්තෙස් - මොළය, අන්වායාම ස්නායු සහ ගැංග්ලියා

24) රසායනික උපාගම හරහා ස්නායු ආවේග සම්ප්‍රේෂණය පිළිබඳ අසත්‍ය වන්නේ,

1) පූර්ව උපාගම පර්යන්තයේ විධ්‍රැවනය නිසා $Ca^{2+}$ අග්‍රස්ථය තුලට විසරණය වෙයි
2) ස්නායු ආවේග පූර්ව උපාගම සෛලයට ගමන් කිරීමෙන් පූර්ව උපාගම අග්‍රයේ සංඥා අවසන් වේ.
3) පශ්ච උපාගම පටලයට ස්නායු සම්ප්‍රේෂක බැඳීම මගින් පශ්ච උපාගම පටලය හරහා $K^+$ හා $Na^+$ අයන විසරණය වේ.
4) ස්නායු සම්ප්‍රේෂක පශ්ච උපාගම පටලයේ ඇති විශිෂ්ට ප්‍රතිග්‍රාහක වලට බැදී ඒවා සක්‍රීය කරයි
5) $Na^+$ හා $K^+$ අයන පශ්ච උපාගම පටලය හරහා විසරණය වූ විට පශ්ච උපාගම පටලයෙහි විධ්‍රැවනය සිදුවේ.

22 A/L අපි [ papers gr

25) ඇසේ කොටස් හා එම කොටස්වලට අදාල කෘත්‍යයන් පිළිබඳ නොගැළපෙන සම්බන්ධය වන්නේ,

1) ස්වච්ඡය - ආලෝක කිරණ වර්තනය කර දෘෂ්යි විතානය මත නාභිගත කිරීම සඳහා දායක වේ.
2) ප්‍රතියෝජක දේහය - අක්ෂි කාචය අවලම්බන බන්ධනී මගින් ස්ථානගත කරයි.
3) තාරා මණ්ඩලය - ආලෝකය විනිවිද යෑම වලකාලයි.
4) කාචය - ඇස ඉදිරියේ වස්තුවෙන් පරාවර්ථනය වී ඇසට ඇතුළු වන ආලෝක කිරණ වර්තනය කරයි.
5) කාච රසය - අන්තඃ අක්ෂි පීඩනය පවත්වාගෙන යාම සිදු කරයි.

26) වැරදි ප්‍රකාශය තෝරන්න

1) මැද කන යනු වාතයෙන් පිරී ඇති ශංඛක අස්ථිය තුළ පවතින කුටීරයකි.
2) අණ්ඩාකාර ගවාක්ෂය නිසාතිය නම් වූ කුඩා අස්ථිකාවක් මගින් ආවරණය වී ඇත.
3) ඇතුළු කණ නිර්මාණය වී ඇත්තේ අස්ථිමය ගහනයෙනි.
4) ඇතුළු කණ අලින්දය, අර්ධ චක්‍රාකාර නාල තුන සහ කර්ණ ශංඛය මගින් සමන්විත වේ.
5) අලින්දය තුම්භිකාව හා මඩිච්චියෙන් සමන්විත වේ.

27) සමේ ඇති යාන්ත්‍රික ප්‍රතිග්‍රාහකයක් නොවන්නේ,

1) ක්‍රවුස් අන්ත බල්බ
2) මිස්නර් දේහානු
3) පැසිනියන් දේහානු
4) මර්කල් මඩල
5) නිදහස් ස්නායු අන්ත

28) පූර්ව පිටියුටරි ග්‍රන්ථිය මත ක්‍රියාකරන හයිපොතැලමසෙන් ස්‍රාවය කරන හෝමෝනයක් නොවන්නේ,

1) GHRIH 2) GnRH 3) PIH 4) ACTH 5) PRH

29) පෝෂී මෙන්ම පෝෂී නොවන බලපෑම් ඇති කරන හෝමෝනය වන්නේ,

1) TSH 2) ACTH 3) FSH 4) GH 5) LH

30) අධි තයිරොයිඩතාවයේ ලක්ෂණයක් [redacted]වන්නේ,

1) ඇස් ඉදිරියට නෙරායාම
2) වියළි සිසිල් සම
3) මළබද්ධය
4) බර වැඩිවීම
5) අලසකම හා මැළිකම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

31) වසා පද්ධතිය පිළිබඳ අසත්‍ය වන්නේ,
1) පටක ආශ්‍රිතව වසා කේශනාලිකා මගින් ආරම්භ වේ.
2) ආහාර මාර්ගයේ ජීර්ණ ඵල අවශෝෂණය සඳහා දායක වේ.
3) වසා වාහිනී ගෙලෙහි පාදස්ථ ප්‍රදේශයේ ඇති ශිරා දෙකක් හා සම්බන්ධ වේ.
4) වසා ගැටිති තැනී ඇත්තේ පේශි පටක හා සුදු රුධිර සෛල වලිනි.
5) වසා වාහිනිවල පවතින කපාට වසා තරලයේ සංසරණය සඳහා වැදගත් වේ.

32) මානව හෘදය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - හෘදයේ බාහිරින් පවතින පෙරිකාඩියම මඩි දෙකකින් තැනී ඇත.
B - මයෝකාඩියමේ විද්‍යුත් සංඥා සම්ප්‍රේෂනය සඳහා වැදගත්වන සන්නයන තන්තු ජාලයක් පවතී.
C - එන්ඩොකාඩියමේ හෘද පේශි සෛල හා පැතලි අපිච්ඡද සෛල පවතී.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,
1) A පමණි  2) B පමණි  3) C පමණි  4) A හා B පමණි  5) A හා C පමණි

33) O රුධිර ගණය දරන පුද්ගලයෙකු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ.
1) ඔහුගේ රක්තාණුවල ප්ලාස්මයේ ප්‍රතිදේහජනක A පවතී.
2) ඔහුගේ ප්ලාස්මාවේ ප්‍රතිදේහ A නැත.
3) ඔහුගේ රක්තාණුවල ප්ලාස්මයේ ප්‍රතිදේහ B පවතී
4) ඔහුගේ ප්ලාස්මාවේ ප්‍රතිදේහජනක A පවතී.
5) ඔහුගේ රක්තාණුවල ප්ලාස්මාවේ ප්‍රතිදේහ ජනක B නැත

34) සක්‍රිය ප්‍රතිශක්තිය පිළිබඳ අසත්‍ය වන්නේ,
1) ව්‍යාධි ජනකයෙකුට එරෙහිව දේහය තුළ ක්‍රියා කරන දීර්ඝ කාලීනව පවතින ප්‍රතිශක්තියයි.
2) ව්‍යාධිජනකයෙකුට විශිෂ්ට වූ B හා T මතක සෛල මගින් හට ගනී.
3) කෘතිම ප්‍රතිශක්තිකරණයේ දී සක්‍රිය ප්‍රතිශක්තිය විකසනය නොවේ.
4) සක්‍රිය ප්‍රතිශක්තිය සඳහා B වසා සෛල හා T වසා සෛල දායක වේ.
5) ස්වාභාවිකව සිදුවන ව්‍යාධිජනක ආසාදනයකදී සක්‍රීය ප්‍රතිශක්තිය විකසනය වේ

35) අසත්‍ය ප්‍රකාශය කුමක්ද?
1) රුධිර ප්ලාස්මාවේ දියවී නිදහස් වායුව ලෙස $CO_2$ සුළු ප්‍රමාණයක් පරිවහනය වේ.
2) රතු රුධිර සෛල තුළ හිමොග්ලොබින් වලට අමතරව මයොග්ලොබින් $O_2$ පරිවහනය සිදු කරයි.
3) සුදු රුධිරාණු හා රුධිර පට්ටිකා, කශේරුකා හා උරෝස්ථිය ආදී අස්ථි වල ඇටමිදුළුවල විකසනය වේ.
4) එරිත්‍රොපොයිටින් හෝර්මෝනය රක්තාණු ජනනය උත්තේජනය කරයි.
5) න්‍යෂ්ටි රහිත රතු රුධිරාණු තුළ ඇති හිමොග්ලොබින් හා බැඳී $O_2$ පරිවහනය වේ.

36) පහත සත්වයන් හා ඔවුන්ගේ බහිස්‍රාවී ඵල පිළිබඳ සත්‍ය වන්නේ,
1) මඩුවා - ඇමෝනියා
2) ගෙම්බා - යූරියා
3) තිලාපියා - යූරික් අම්ලය
4) කිඹුලා - යූරියා
5) භෞමික ගොළු බෙල්ලා - යූරියා

22 A/L අපි [ papers grp ]



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CamScanner

37) මිනිස් වෘක්කයේ විදූර සංවලිත නාලිකාව පිළිබඳ අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

1) දේහ තරල වල $K^+$ හා $Na^+$ සාන්ද්‍රනය යාමනයට වැදගත් වේ.
2) පෙරනය තුළට සක්‍රිය $K^+$ ස්‍රාවය වේ.
3) දේහ අවශ්‍යතාව මත පෙරනයෙන් $Na^+$ ප්‍රතිශෝෂණය වේ.
4) pH යාමනය සඳහා $H^+$ ස්‍රාවය හා $HCO_3^-$ ප්‍රතිශෝෂණය සිදුවේ.
5) ඇල්ඩෙස්ටෙරෝන් හෝමෝනයේ බලපෑමෙන් $K^+$ බහිස්‍රාවය වැඩි කරයි.

38) ශ්‍රී ලංකාවේ හඳුනානොගත් නිදන්ගත වකුගඩු රෝගය සඳහා උපකල්පිත හේතුවක් නොවන්නේ,

1) මුත්‍රාවල ක්ෂාරීය බව වැඩි වීම.
2) පානීය ජලයේ ඇති අධික $F^-$ ප්‍රමාණය
3) ප්‍රවේණික සාධක
4) මන්දපෝෂනය හා විජලනය
5) පළිබෝධනාශකවලට නිරාවරනය වීම

22 A/L අපි [pape

39) මානව ප්‍රජනනයේ හෝමෝනමය යාමනය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - පූර්ව පිටියුටරියෙන් ස්‍රාවය වන FSH හා LH මට්ටම ඉහල යෑම ශුක්‍රාණු ජනනය සිදු කරයි.
B - FSH ලේඩිග් සෛල වලින් ටෙස්ටොස්ටෙරෝන් නිපදවීම උත්තේජනය කරයි.
C - ස'ටෝලි සෛලවලින් නිපදවෙන ඉන්හිබින් පූර්ව පිටියුටරියෙන් FSH ස්‍රාවය අඩු කරයි.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

1) A පමණි 2) A හා B පමණි 3) A හා C පමණි 4) C පමණි 5) B පමණි

40) ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ අසත්‍ය වන්නේ,

1) ඒඩ්ස් හා සිපිලිස් උපතේදී මවගෙන් දරුවාට සම්ප්‍රේෂණය විය හැක.
2) ගොනෝරියා තත්වයේදී කාන්තාවන්ගේ පැලෝපීය නාල සැරව වලින් පිරීයාම හා වඳ භාවය ඇතිවේ.
3) දීර්ඝකාලීන වියලි කැස්ස ආහාර අරුචිය, ඒඩ්ස් රෝගයේ රෝග ලක්ෂණයන්ය.
4) හර්පීස් වෛරසයේ ක්‍රියාකාරීත්වයෙන් ලිංගික ප්‍රදේශ වටා වේදනාකාරී කැසිල්ලක් ඇතිවේ.
5) සිපිලිස් වෛරස මගින් සම්ප්‍රේෂණය වන අතර දේහයේ වණ හා බිබිලි ඇතිවේ.

41-50 ප්‍රශ්නවලට දී ඇති ප්‍රතිචාර අතුරින් එකක් හෝ ඊට වැඩි ගණනක් නිවැරදිය. කවර ප්‍රතිචාරය/ ප්‍රතිචාර නිවැරදි ද යන්න විනිශ්චය කර ඒ අනුව නිවැරදි අංකය තෝරන්න.

A, B, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................ (1)
A, C, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................ (2)
A හා B යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................ (3)
C හා D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................ (4)
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් නිවැරදි නම් (5)

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| A, B, D පමණක් නිවැරදියි | A, C, D පමණක් නිවැරදියි | A, B පමණක් නිවැරදියි | C, D පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදිය |

41) තරඟකාරී නිශේධක

A) උපස්තරයේ ස්වභාවයට සමාන වේ
B) බොහොමයක් ප්‍රතිවර්ත්‍ය නිශේධක වේ
C) එන්සයිමයේ හැඩය වෙනස් කරයි
D) උපස්තරය සඳහා ඇති සක්‍රිය ස්ථාන අඩු කරයි
E) එන්සයිමයේ සක්‍රිය ස්ථානයේ එන්සයිම උපස්තර සංකීර්ණ සෑදීමේ ඵලදායී බව අඩු කරයි



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CamScanner

42) ප්‍රභාසංස්ලේෂණයේ දී මෙන්ම සෛලීය ශ්වසනයේදීද සෑදෙන සංයෝගයක් / සංයෝග වන්නේ,

A) රිබියුලෝස් බිස්ෆොස්ෆේට්
B) පොස්ෆොඊනෝල් පයිරුවේට්
C) ඔක්සැලෝ ඇසිටේට්
D) ග්ලිසරැල්ඩිහයිඩ් 3 - පොස්පේට
E) සිට්රේට්

22 A/L අපි [ papers grp ]

43) Phylum Annelida හි දැකිය හැකි ව්‍යුහයක් / ව්‍යුහ වන්නේ,

A) සීලෝමය
B) චූෂකර
C) උදරීය ස්නායු රැහැන්
D) අන්තඃසැකිල්ල
E) දේහ බිත්තියේ අන්වායාම පේශි පැවතීම

44) සහවර සෛල සම්බන්ධයෙන් පහත කුමන වගන්තිය / වගන්ති සත්‍ය වේද?

A) සෑම සහවර සෛලයක්ම ජලෝයම බැර කිරීමට දායක වේ
B) පරිණත වන විට ඒවා අජීවී වේ
C) මේවා තුලින් ද්‍රව්‍ය ගමන් නොකරයි
D) එක්, එක් පෙනේර නල ඒකකයට යාබදව පිහිටයි
E) ඩෙස්මොසෝම මගින් පෙනේර නළ ඒකක සමග සම්බන්ධ වේ

45) ශාක ආලෝකය කෙරෙහි දක්වන ප්‍රතිචාර සම්බන්ධව සත්‍ය වන්නේ,

A) 660 nm තරංග ආයාමයක් සහිත රතු ආලෝකය බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය වැඩි කරයි
B) දූර රක්ත කිරණ වලට : රතු ආලෝකය දරණ අනුපාතය වැඩි වීමෙන් අතු බෙදීම උත්තේජනය වේ.
C) ක්‍රිප්ටොක්‍රෝම් මගින් සෙවන මග හැරීම සිදු කරයි.
D) සෛල ආලෝකයට නිරාවරණය වූ විට ඔක්සීන වැඩි සාන්ද්‍රණයක් මගින් කඳ දික්වීම උත්තේජනය කරයි
E) බීජ පැළය පස මතුපිටට පැමිණි විට ආලෝකය ප්‍රේරණයෙන් බීජ මූලය දික්වීම නිශේධනය කරයි

46) මිනිස් සිරුරේ සහජ ප්‍රතිශක්තියේ බාහිර ආරක්ෂණය සඳහා දායක වන භෞතික හා රසායනික බාධකය/ බාධක වන්නේ,

A) සමෙහි හමුවන බාහිර ආරක්ෂන හෝ බාදක
B) විවිධ අවයවවලින් නිකුත්වන ස්‍රාව
C) ඉන්ටෆෙරෝන්
D) ශ්ලේෂ්මල පටලය
E) ස්වාභාවික නාශක සෛල

47) මානව කළල විකසනය සම්බන්ධ සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

A) කළල විකසනයේ පළමු සති 2 - 4 කාලයේදී කළලය සෘජුවම එන්ඩොමෙට්‍රියමෙන් පෝෂණය ලබයි.
B) කෝරියම මගින් ගර්භණීභාවයේදී අවශ්‍ය වන හෝමෝනයක් වන hCG නිපදවයි
C) කළලයේ හෘදය ස්පන්දනය ආරම්භ වීම සති 12 පමණ පසුව සිදුවේ.
D) දෙවන ත්‍රෛමාසිකය වන විට භ්‍රෑණය 60 cm පමණ වැඩි පවතී.
E) ගර්භණීභාවය හඳුනා ගැනීම සඳහා මවගේ මුත්‍රා පරික්ෂාවෙන් ඊස්ට්‍රජන් හඳුනා ගනී.

48) ආස්‍රැති විධානය සඳහා සහභාගී වන හෝමෝන/ හෝමෝනය වන්නේ,

A) ADH
B) ඇල්ඩොස්ටෙරොන්
C) ඇන්ජියොටෙන්සින් II
D) ඇන්ජියොටෙන්සිනෝජන්
E) එරිත්‍රොපොයිටින්



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CamScanner

49) සමස්ථිතිය සඳහා අක්මාවේ කාර්යක් නොවන්නේ,

A) කාබෝහයිඩ්‍රේට පරිවෘත්තිය

B) රතු රුධිරාණු බිඳ දැමීම

C) හෝමෝන නිපදවීම

D) න්‍යෂ්ටික අම්ල පරිවෘත්තිය

E) තාපය නිපදවීම

50) මානව ගොනැඩ මගින් නිපදවන හෝමෝන/ හෝමෝනයක් වන්නේ,

A) FSH

B) LH

C) GnRH

D) ටෙස්ටොස්ටෙරෝන්

E) ප්‍රොජෙස්ටරෝන්

22 A/L අපි [ papers grp ]



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
CamScanner

සියලුම හිමිකම් ඇවිරිනි/ All Rights Reserved

# රාජකීය විද්‍යාලය – කොළඹ 07

13 ශ්‍රේණිය

පළමු වාර පරීක්ෂණය – 2023 'අප්‍රේල්

ජීව විද්‍යාව II

09 | S | II

B කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

(එක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 150 කි.

1) a) වර්ගීකරණ ක්‍රම විස්තර කරන්න.

b) නිඩාරියා වංශයේ (Phylum – Cnidaria) ලාක්ෂණික ලක්ෂණ විස්තර කරන්න.

22 A/L අපි [ papers grp ]

2) a) ද්විශීය ද්විබීජ පත්‍රී ශාක පත්‍රයක ව්‍යුහය විස්තර කරන්න.

b) ශාක පත්‍රය ආලෝක අධිග්‍රහණයට දක්වන අනුවර්තන විස්තර කරන්න.

3) a) සංවේදී ප්‍රතිග්‍රාහක වල මූලික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

b) සංවේදී ප්‍රතිග්‍රාහක විස්තර කරන්න.

4) a) කංකාල පේෂී පටකය විස්තර කරන්න.

b) පුළුල් පරාසයක් ඔස්සේ චලනය සඳහා මිනිසාගේ ඉහළ ගාත්‍රයේ දක්නට ලැබෙන අනුවර්තන විස්තර කරන්න.

5) a) මුත්‍රා නිපදවීමේ ක්‍රියාවලිය සඳහා මිනිසාගේ වෘක්කාණුව සැකසී ඇති ආකාරය පැහැදිලි කරන්න.

b) මුත්‍රා නිපදවීමේ ක්‍රියාවලියේ හෝමෝනමය යාමනය පැහැදිලි කරන්න.

6) කෙටි සටහන් ලියන්න.

a) ප්‍රේරිත සීහුම් යාන්ත්‍රණය

b) ප්‍රතිදේහ

c) මානව ඩිම්බකෝෂය



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
CamScanner